# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු/ සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (නව නිර්දේශය)

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH – E 2015**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. | කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස් ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

අ) එබස් ඇසූ උපාසකවරහු වෙළුවන මහාවිහාරයට ගොස් සිවුවණක් මහපිරිස්මධ්‍යයෙහි ආසාධාරණ වූ බුඩවිලාසයෙන් සියලුලොව සනහමින්, අසන කණට සුව කොට, විඳුනා සිතට මිහිරි කොට, ඉහලොක දක්වමින්, පරලොක දක්වමින්, නිවන් මඟ හෙළි කරමින්, මහාකරුණායෙන් යොදා, මහාප්‍රඥායෙන් සියුම් කොට, වදාරණ බණ අසා නිවී සැනහී, ශ්‍රීපාදනබරශ්මි නැමති අමාහැල්ලෙහි ගැලී වැඳැ ගෙණැ හෙවැ එකත්පස් වැ සිටැ "ස්වාමීනි දන්වන්නෙක් ඇති"යි කියා "කියව"යි කීකලැ ""දෙව්දත්හු අජාසත් රජ්ජුරුවන් පහදවා ගෙණැ සෙටැ නුඹ වහන්සේ සිඟා වඩනා මඟට නාලාගිරි නම් ඇත්හු මෙහෙයෙති. ඒ ඇත් මද හී සිටියේ චණ්ඩ යැ. පරුෂ යැ. බුඩත්නය, ධර්මරත්නය, සඞසරත්නය යන ත්‍රිරත්නය නො හඳුනයි. ස්වාමීන්ගේ ආනුභාව දන්නා කෙනෙකුන් වුව හොත් හික්මවා ගැන්ම ස්වාමීන්ට පිළිවන්බව දනුම්හ. මේ වූ කලි මදයෙන් අන්ධ යැ. මෙ තිරිසනැ. ගැත්තවුන් සෙනහයෙන් පක්ෂපාත කමින් දන්වන බස්බැවින් සෙට සිඟා නො වැඩැ විහාරයෙහි මැ වැඩැ හිඳැ ගැත්තවුන් ගෙණා දන් මොබැ දී මැ වළඳනබව යහපතැ"යි දැන්වූහැ.

ආ) රජ්ජුරුවෝ සේනකයාගේ බස් අසා පුක්කුසාදි තුන් දෙන නො විචාරා, පස් දෙනාට කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට, "අලාමක වූ නුවණැති සියලු ධර්මයන් සර්වාකායෙන් දන්නා වූ මහෞෂධ පණ්ඩිතයෙනි, තොප විචාරමි. නුවණ නැති පරිවාර සම්පත් ඇති, පරිවාර සම්පත් නැති නුවණ ඇති, මේ දෙදෙනා අතුරෙන් නුවණැත්තෝ කා උතුමැයි කියද්ද, කියා ලව" යි කීහ. ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජ්ජුරුවනට, "ඇසුව මැනැව, දේවයන් වහන්සැ" යි ගාථායෙකින් ස්ථානාන්තරාදි කිසි ලාභ සම්පත්තියෙක් ලදින් ම, 'මේ උතුමැ'යි සිතන්නා වූ අඥාන තෙමේ පාණාතිපාතාදි පාප ධර්මයන් කරන්නේ ය. එ සේ හෙයින් මේ ලොව බලන්නේ ඓශවර්ය මදයෙන් ප්‍රමාද වැ කළා වූ පාපා කර්ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුඃඛයට භාග් වන්නේ ය. මෙසේ උපේක්ෂාපූර්වාංග වූ චිනිතාවක් නැති වැ පරලොව නොබලන්නේ දෙ ලොවෙහි ම හෙවත් ඉසුරු මදයෙන් පව් කොට නරකාදියෙහි උපදනේ පර ලොවැ ද, නැවැත එයින් ච්‍යුත වැ දිළිඳු කුලයෙහි නොයෙක් දුකට භාජන වැ උපදනේ මේ ලොව දැ යි, මෙසේ දෙලොවෙහි ම නුවණ නැති තැනැත්තේ පරාජයක් ගන්නේ ය;

02. අනුරාධපුර යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ විමසීමක් කරන්න.

නැතහොත්

දඹදෙණි යුගයේ ගද්‍ය සාහිත්‍යයේ විශේෂතා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

03. "සද්ධර්මරත්නාවලියේ කතා කලාව මගින් කතුවරයා සතු අනන්‍යතා ලක්ෂණ අනාවරණ වේ." මෙම ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

## II කොටස

04. සිංහල නවකතාව බිහිවීමට බලපෑ තත්කාලීන සමාජ, ආර්ථික, දේශපාලන සාධක කවරේ දැයි සනිදර්ශන ව පහදන්න.

05. බැද්දේගම නවකතාවෙහි නිරූපිත ගම විනාශ මුඛයට පාත්‍ර වීම කෙරෙහි බලපෑ හේතු සාධක මොනවාදැයි විමර්ශනය කරන්න.

06. දියමන්ති මාලය කෘතියෙන් තෝරාගත් කතා දෙකක් පිළිබඳ විචාර සපයන්න.

## III කොටස

07. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ විශේෂතා හඳුන්වමින් සකුන්තලා නාට්‍යය පිළිබඳ විමර්ශනයක් කරන්න.

08. ග්‍රීක ශෝකජනක නාට්‍ය කලාව පිළිබඳ විමසීමක් කරන්න.

09. "සාහිත්‍යය හා සංසන්දනයේ දී චිත්‍රපටය අනන්‍යතා ලක්ෂණ ප්‍රකට කරන ස්වාධීන කලාංගයකි." තත් මතයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

10. "සමාජ, ආර්ථික හා දේශපාලනික දැක්මක් සහිත ව සිනමා මාධ්‍යය හැසිරවූ අධ්‍යක්ෂවරයෙකු ලෙස ධර්මසේන පතිරාජ හැඳින්විය හැකිය." පාර දිගේ සිනමා පටය ඇසුරෙන් පහදන්න.

***********************************